# පාලි ස්වර මාලාව පිළිබඳව ශාබ්දිමමය අර්ථකථනයක්

ඩබ්ලිව්. එම්. දේශප්‍රිය ගුණසේන

## හැඳින්වීම

ශබ්දිම සංකල්පය විසිවැනි සියවසෙහි බිහි වූ වාග්විද්‍යාත්මක සංකල්පයකි. එහෙත් පාලි භාෂාව මීට ශතවර්ෂ විසි හයකට අධික තරම් ඈත අතීතයකට අයත් පෙරදිග සාහිත්‍යයික භාෂාවකි. මේ භාෂාව නිරූපණයවීම සඳහා විශේෂිත වූ ලිඛිත සංකේත මාලාවක් ද නැත. ලංකාවෙහි සිංහල අක්ෂරයෙන් ද, බුරුමයෙහි බුරුම අක්ෂරයෙන් ද, ඉන්දියාවේ ග්‍රන්ථාරූඪ ත්‍රිපිටකය දේවනාගරී අක්ෂරයෙන් ද නිරූපණය වේ. පාලි භාෂාව සඳහා ඊටම ආවේණික වූ ලිඛිත සංකේත මාලාවක් නොතිබීම ගැටලුවකි. එබැවින් පාලි ත්‍රිපිටක ග්‍රන්ථ ලේඛනගතවීමේදී ඒ ඒ රටවල මාතෘභාෂාගත සංකේතාක්ෂර වලින් ම නිරූපණය වී තිබේ. පාලි අක්ෂරමාලාවේ වර්තමාන උච්චාරණ රටාව සිංහල සංකේත මගින් නිරූපිත පාලි ව්‍යාකරණ ග්‍රන්ථ වලට අනුව උච්චාරණ රටා ගොඩනැගී ඇත. මේ භාෂාව බිහි වූ ඉන්දියාවේ මධ්‍යමණ්ඩලයේ මගධදේශයේ පැවති උච්චාරණ රටාව කුමක්ද? එය නිරූපිත සංකේත මාලාව කවරාකාරද? වර්තමානයේ ලංකාවේ පාලි අක්ෂර උච්චාරණ රටාවත් අතීත මගධදේශීය පාලි අක්ෂර උච්චාරණ රටාවත් එකක්ද? මෙය විමසා බැලීම දුෂ්කර වූවකි. අතීත උච්චාරණ රටාව හඳුනාගැනීමට ක්‍රමවේදයක් හෝ ඊට අයත් ලිඛිත සාධක හෝ මෙහෙයක් හඳුනාගෙන නැත. එබැවින් දැනට විද්‍යමාන සිංහල අක්ෂරයෙන් නිරූපිත පාලි කච්චායන ව්‍යාකරණයෙහි ඇතුළත් අක්ෂරමාලාව පිළිබඳ වාග්විද්‍යාත්මක විග්‍රහයක් මෙයින් ඉදිරිපත් වේ.

ශබ්දිම නියෝජක වර්ණ මාලාවක විද්‍යමාන මූලික ලක්ෂණ තුනක් ගැන වාග් විද්‍යාඥයෝ දක්වති. එනම්,

i. වර්ණමාලාව උපරිම පිරිමැස්මකින් යුක්තවීම
ii. සෑම වෛශේෂික ශබ්දයක් ම නියෝජනය කිරීමට සලකුණු තිබීම